9355

AL/2026/51/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

චිත්‍ර කලාව I
சித்திரக்கலை I
Art I

**51 S I**

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

විභාග අංකය : ......................................

**උපදෙස්:**

※ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත ය.

**I කොටස**
- ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියෙන් ඇති **තිත් ඉර මත** ලියන්න.

**II කොටස**
- අනුකොටස් **තුනකින්** සමන්විත ය.
- '**අ**' කොටසින් ප්‍රශ්න **දෙකක්** හා 'ආ' සහ '**ඉ**' යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

※ **I** කොටසට හා **II** කොටසට අයත් පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දෙන්න.

| පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණයි. | |
|---|---|
| **I පත්‍රය සඳහා** | |
| **කොටස** | **ලකුණු** |
| I | |
| II | |
| **එකතුව** | |
| 1 වැනි පරීක්ෂක | 2 වැනි පරීක්ෂක |
| | |

## I කොටස

- ප්‍රශ්න අංක **1** සිට **5** තෙක් එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන වරණය** තෝරන්න.

**1.** මහින්දාගමනයෙන් පසු ශ්‍රී ලංකාවේ ඉදි වූ ඉපැරණි ම චෛත්‍යය වනුයේ,
(1) මිහින්තලේ අම්බස්තල දාගැබයි.
(2) මිහින්තලේ කණ්ඨක චේතියයි.
(3) අනුරාධපුර මිරිසවැටිය දාගැබයි.
(4) අනුරාධපුර ථූපාරාම දාගැබයි.
(5) අනුරාධපුර ජේතවනාරාම දාගැබයි. (.........)

**2.** නව කැළණි විහාරයේ බිතු සිතුවම් නිර්මාණයේ දී,
(1) නූතන විහාර සිතුවම් ශෛලියක් හඳුන්වා දී ඇත.
(2) තේමා දෙකක් යටතේ සිතුවම් නිමවා ඇත.
(3) පෙර අපර දෙදිග සම්ප්‍රදායන් අධ්‍යයනය කර ඇත.
(4) ලාලිත්‍ය ගුණයෙන් යුත් රේඛා භාවිත කර ඇත.
(5) ත්‍රිමාණ ලක්ෂණ මතුකෙරෙන වර්ණ මාලාවක් යොදාගෙන ඇත. (.........)

**3.** ප්‍රාග් ඓතිහාසික මානවයාගේ සිතුවම් නිමැවුමේ අභිප්‍රාය වූයේ,
(1) විවේකී අවස්ථාවල, දඩයමේ දී ලද අත්දැකීම් චිත්‍රණය කිරීමයි.
(2) සත්ත්ව රූ ඇඳීමෙන් මානසික තෘප්තියක් ලැබීමයි.
(3) සත්ත්ව රූ ඇඳ තැබීමෙන් සතුන් තම ගොදුරට අසුවේ ය යන විශ්වාසයයි.
(4) සතුන් පිළිබඳ ඔවුන් තුළ වූ විශ්වාස චිත්‍ර මගින් ප්‍රකාශ කිරීමයි.
(5) රුදුරු වන සතුන්ගෙන් වනයේ දී ආරක්ෂාවීමයි. (.........)

[දෙවැනි පිටුව බලන්න.

Past Papers Wiki



**4.** අනුරාධපුර යුගයට අයත් හිඳගල සිතුවම් තුළ වූ විශේෂත්වය වනුයේ,
(1) රේඛා මගින් ප්‍රස්තුතය ඉස්මතු කර දැක්වීමයි.
(2) වර්ණ භාවිතයෙන් මානව රූ තුළ ත්‍රිමාණබව දැක්වීමට උත්සාහ දැරීමයි.
(3) එක් සිදුවීමක් එක් තලයක් තුළ ප්‍රකාශ කිරීමට උත්සාහ දැරීමයි.
(4) බුදුරුව හා මානව රූ ස්වාභාවිකව ඇඳීමට උත්සාහ දැරීමයි.
(5) සිද්ධි නිරූපණයේ දී මානව ක්‍රියාකාරකම් පෙන්වීමට උත්සාහ දැරීමයි. (.........)

**5.** කොළඹ යුගයේ බිහි වූ චිත්‍ර ශිල්පීන් අතුරෙන් ඇම්. සාර්ලිස් සිත්තරා සුවිශේෂී වන්නේ,
(1) බෞද්ධ සිතුවම් මුද්‍රිත මාධ්‍යයෙන් නිර්මාණය කිරීමට පුරෝගාමී වූ ශිල්පියා නිසා ය.
(2) ශ්‍රී ලංකාව පුරා විහාර විශාල සංඛ්‍යාවක සිතුවම් නිර්මාණය කළ ශිල්පියා නිසා ය.
(3) බිතු සිතුවම්වල ගෘහ නිර්මාණ හා වස්ත්‍රාභරණ ඉන්දීය ලක්ෂණ අනුව සිතුවම්කරණය කළ නිසා ය.
(4) චිත්‍ර මෙන් ම මූර්ති ශිල්පයට ද සුවිශේෂී හපන්කම් දැක් වූ ශිල්පියෙකු වීම නිසා ය.
(5) චිත්‍ර කලා මූලධර්ම පදනම් කරගෙන තම සිතුවම් ශෛලිය ගොඩනගාගත් නිසා ය. (.........)

● ප්‍රශ්න අංක **6** සිට **10** තෙක් අසා ඇති ප්‍රශ්නවලට **වඩාත් ගැළපෙන වරණය 1** සිට **9** තෙක් අංක කර ඇති සිතුවම් ඇසුරෙන් තෝරන්න.


**1**


**2**


**3**


**4**


**5**


**6**


**7**


**8**


**9**

**6.** පියේ මොන්ඩ්‍රියාන්ගේ චිත්‍ර ආභාසය තම සිතුවම් සඳහා යොදාගත් ශ්‍රී ලාංකේය චිත්‍ර ශිල්පියාගේ සිතුවම කුමක් ද?
(1) **1** (2) **2** (3) **3** (4) **6** (5) **8** (.........)

**7.** ලෝකයේ ප්‍රකෘති ස්වභාවය ශෛලීගතව අධ්‍යයනය කළ ශිල්පීන්ගේ කෘති මොනවා ද?
(1) **1,3** (2) **2,3** (3) **3,6** (4) **6,7** (5) **8,9** (.........)

**8.** විෂයාත්මක ඉරියව් වෙනුවට භාවාත්මක ඉරියව් දැක්වෙන මූර්ති අතුරෙන්, ඓතිහාසික යුග අනුව පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?
(1) **4,8,9** (2) **4,9,8** (3) **8,4,9** (4) **8,9,4** (5) **9,8,4** (.........)

**9.** ඝණිකවාදී කලා ආභාසය ඇසුරෙන් නිර්මාණය කරන ලද සිතුවම් මොනවා ද?
(1) **1,2,3** (2) **1,6,7** (3) **2,3,5** (4) **2,3,6** (5) **3,6,7** (.........)

**10.** පුනරුද, උපස්තිථිවාදී, ඝණිකවාදී සහ ව්‍යුක්ත ප්‍රකාශනවාදී සිතුවම් පිළිවෙළින් දක්වා ඇති වරණය කුමක් ද?
(1) **5,1,6,3** (2) **5,2,1,7** (3) **5,3,6,2** (4) **5,3,7,1** (5) **5,7,2,1** (.........)

[තුන්වැනි පිටුව බලන්න.

● ප්‍රශ්න අංක **11** සිට **15** තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන වරණය A, B, C, D, E** ලෙස නම් කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරෙන් තෝරන්න.



A



B



C



D



E

**11.** A අක්ෂරයෙන් දැක්වෙන හැරී පීරිස් ශිල්පියාගේ 'ඉන්ද්‍රාණි' නම් වූ සිතුවම
   (1) ඒක වර්ණික වර්ණ ප්‍රභේද සහිත සිතුවමකි.
   (2) වේගවත් පින්සල් පහරින් නිමවූ ආලේඛ්‍ය සිතුවමකි.
   (3) ශාස්ත්‍රාලයීය යථාර්ථවාදයෙන් තොර ප්‍රකාශනවාදී සිතුවමකි.
   (4) බහු ශෛලීය කලා ලක්ෂණ ප්‍රකාශිත සිතුවමකි.
   (5) ස්වාභාවික ලක්ෂණ මතු වන සේ වර්ණ භාවිත කළ සිතුවමකි. (.........)

**12.** B අක්ෂරයෙන් දක්වෙන ජෝර්ජ් කීට් ශිල්පියාගේ 'ජරසන්ද' නම් වූ සිතුවම,
   (1) ඝණිකවාදී ආකෘතියක් මත ගොඩනගන ලද්දකි.
   (2) බහුවර්ණික තෙල් සායම් භාවිතයෙන් කරන ලද්දකි.
   (3) ශෛලීගත ආකෘතියක් මත කරන ලද්දකි.
   (4) වස්තූන්ගේ ප්‍රකෘති ස්වභාවය විකෘති කොට දක්වන ලද්දකි.
   (5) ව්‍යුක්තරූපී හැඩතල ඇසුරෙන් කරන ලද්දකි. (.........)

**13.** C අක්ෂරයෙන් දක්වෙන පෝල් ගෝගැන් ශිල්පියාගේ 'කහ පැහැති ක්‍රිස්තුස්වහන්සේ' (The Yellow Christ) නම් වූ සිතුවම,
   (1) නූතන කලාවේ සංරචන ප්‍රයෝග උපයෝගී කර ගත්තකි.
   (2) ව්‍යුක්ත කලාවේ ප්‍රකාශනශීලීබව, සංකේතාත්මකව ප්‍රකාශ කිරීමකි.
   (3) ස්වාභාවිකවාදී ප්‍රවේශයන් අනුව ත්‍රිමාණ ලක්ෂණ යොදා ගත්තකි.
   (4) ප්‍රකෘති ලෝකයේ දෘශ්‍ය අරමුණු ව්‍යුක්තකරණය කරන ලද්දකි.
   (5) හැඩතල මතුකිරීම සඳහා රේඛා හා වර්ණ යොදා ගත්තකි. (.........)

**14.** D අක්ෂරයෙන් දක්වෙන පෝල් සෙසාන්ගේ 'කාඩ් සෙල්ලම්කරන්නෝ' (The Card Players) නම් වූ සිතුවම,
   (1) ස්වාභාවික හැඩතල ඒ ආකාරයෙන්ම යොදාගෙන කරන ලද්දකි.
   (2) අඳුරු පැහැති වර්ණ මාලාවක් මානව රූ සඳහා යොදා ගත්තකි.
   (3) ඝණරූපී ලක්ෂණ ප්‍රකාශවන අයුරෙන් වර්ණ භාවිත කරන ලද්දකි.
   (4) නිර්මාණයේ දී ප්‍රස්තුතය නාභිගතව හා සෙසු කොටස් සමබරතාවය රැකෙන සේ යොදා ඇත.
   (5) උපස්ථිතිවාදී කලාවේ ආභාසය අනුගමනය කරමින් අඳින ලද්දකි. (.........)

**15.** E අක්ෂරයෙන් දක්වෙන රාජා රවි වර්මාගේ 'සරස්වතී' සිතුවම,
   (1) යුරෝපීය ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී ශිල්පක්‍රම අනුගමනය කරමින් කළ නිර්මාණයකි.
   (2) මනඃකල්පිත රූපයක් කැන්වසය මත ප්‍රතිනිර්මාණය කරන ලද්දකි.
   (3) ස්වාභාවික ආලෝක තත්ත්ව භාවිත කොට රූපවල කොටස් අවධාරණය කරන ලද්දකි.
   (4) කැන්වසය මත වස්තූන් වඩාත් පරිපූර්ණ ආකෘතියකින් නිර්මාණය කිරීමකි.
   (5) භූ දර්ශන හා පසුතලය මානව රූප සමග ගලපා නිම කරන ලද්දකි. (.........)

PAST PAPERS WIKI

Past Papers Wiki



● ප්‍රශ්න අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන වරණය** පහත සඳහන් **F, G, H, I, J** ලෙස නම් කර ඇති කැටයම්වල ඡායාරූප ඇසුරෙන් තෝරන්න.


F


G


H


I


J

**16.** **F** අක්ෂරයෙන් දැක්වෙන බිසෝ මාලිගයේ සඳකඩපහණ

(1) අර්ධ වෘත්තාකාර තීරු කිහිපයකට බෙදා කරන ලද කැටයම් පුවරුවකි.
(2) ඉතා විශිෂ්ට ගනයේ කැටයමින් අලංකාර කරන ලද නිර්මාණයකි.
(3) අනුරාධපුර යුගයේ කලාත්මකබවින් උසස් ම සඳකඩපහණයි.
(4) බෞද්ධාගමික සංකල්පයක් වන භව චක්‍රය නිරූපිත කැටයමකි.
(5) ආගමික සිද්ධස්ථානයකට ඇතුළුවන පියගැට පෙළ පාමුල කළ කැටයමකි. (.........)

**17.** **G** අක්ෂරයෙන් දැක්වෙන පනාවිටිය අම්බලමේ දැව කැටයම

(1) ගම්පොළ යුගයට අයත් පොදු ගොඩනැගිල්ලක දක්නට ඇත.
(2) නුවර සාම්ප්‍රදායික සිතුවම් ඇසුරෙන් කරන ලද්දකි.
(3) තෙළිමේ ක්‍රමවේදය අනුව කරන ලද අල්පඋන්නත කැටයමකි.
(4) විස්තරාත්මක තොරතුරු අවම වූ රළු ස්වරූපයක් ගත් කැටයමකි.
(5) දැවයෙන් කළ ගෘහ නිර්මාණයක් අලංකාර කිරීමට කළ කැටයමකි. (.........)

**18.** **H** අක්ෂරයෙන් දැක්වෙන රත්න ප්‍රාසාදයේ නාග රාජ මුරගල

(1) අවස්ථා කිහිපයක දී සිදු වූ ක්‍රමික විකාශනයේ උසස් ම අවස්ථාවකි.
(2) ආගමික සිද්ධස්ථානයක ආරක්ෂාව සංකේතවත් කරන්නකි.
(3) කොරවක්ගලට ආධාරකයක් ලෙස ඉදි වූවකි.
(4) නාග ගෝත්‍රිකයෝ මුරකාවලෙහි යෙදවීම සංකේතවත් කිරීමකි.
(5) නා පෙණ සහිත හිස්වැස්මක් නිසා නාග රාජ ලෙස නම් ලැබූවකි. (.........)

**19.** **I** අක්ෂරයෙන් දක්වෙන ඉන්දු නිම්නයෙන් හමු වූ මුද්‍රාව

(1) වෙස් මුහුණක් පැළඳි වෘක්ෂ දේවතාවෙක් නිරූපණය කරයි.
(2) රුදුරු වන සතුනට අධිපති දෙවියා නිරූපණය කරයි.
(3) සතුන් බිලි පූජාවට ගන්නා දෙවියෙක් නිරූපණය කරයි.
(4) රෝග සුව කිරීමට හැකියාවක් සහිත දෙවියෙක් නිරූපණය කරයි.
(5) හිස් පළඳනාවක් පැළඳි යෝගාසනාරූඪ දෙවියෙක් නිරූපණය කරයි. (.........)

**20.** **J** අක්ෂරයෙන් දක්වෙන මහා කපි ජාතකය නම් භාරුත් කැටයම

(1) ප්‍රාණපූර්ණබවින් හා සියුම්බවින් යුත් ප්‍රකාශනයකි.
(2) අවස්ථා කිහිපයක් ලඝුකොට ප්‍රස්තුතය නිරූපණය කරන්නකි.
(3) ස්වාභාවිකත්වයට සමීප සංකල්පීය ලක්ෂණ පෙන්නුම් කරන්නකි.
(4) ත්‍රිමාණ ලක්ෂණ මනාව නිරූපිත කැටයම් පුවරුවකි.
(5) ශිල්පීය කුසලතාවය මනාව ඉස්මතුවන ප්‍රකාශනයකි. (.........)

● ප්‍රශ්න අංක **21** සිට **25** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන වරණය** පහත සඳහන් **K, L, M, N, O** යනුවෙන් නම් කර ඇති කලා කෘති ඇසුරෙන් තෝරන්න.


K


L


M


N


O

**21.** **K** අක්ෂරයෙන් දැක්වෙන මහඉලුප්පල්ලම ගොවිපළේ දක්නට ඇති බුදු පිළිමය,
(1) හුණුවැලිගලින් නිර්මිත ඉපැරණි හිටි පිළිමයකි.
(2) සමභංග ඉරියව්වෙන් හා ඒකාංග චීවරයෙන් නෙළා ඇති පිළිමයකි.
(3) අවුකන පිළිමය නිර්මාණයට ආදර්ශ සැපයූ පිළිමයයි.
(4) ඉන්දීය අමරාවතී ලක්ෂණ නිරූපිත ශ්‍රී ලංකාවෙන් හමුවන ඉපැරණි ම ප්‍රතිමාවයි.
(5) එහි මුද්‍රා හා චීවරය තුළින් ඉන්දීය කලා ලක්ෂණ නිරූපණය කරයි. (.........)

**22.** **L** අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) පොත්ගුල් විහාරය අසල පිහිටි ත්‍රිභංග ඉරියව්වෙන් යුතු පිළිමයකි.
(2) පරාක්‍රම සමුද්‍රය අසල පිහිටි පූර්ණ උන්නතව නෙළා ඇති ප්‍රතිමාවකි.
(3) පොළොන්නරු යුගයට අයත් ආබද්ධව නෙළා ඇති ප්‍රතිමාවකි.
(4) ලෞකික තේමාවක් ඇසුරෙන් කරන ලද අධි උන්නත පිළිමයකි.
(5) පොළොන්නරු යුගයට අයත් ඍජු කයෙන් යුතු රාජකීයයෙකු නිරූපිත පිළිමයකි. (.........)

**23.** **M** අක්ෂරයෙන් දැක්වෙන 'තක්තිබහීර්' පිළිමය,
(1) ධ්‍යාන මුද්‍රාවෙන් වැඩ හිඳින පිළිමයකි.
(2) වීරාසන ක්‍රමයෙන් වැඩ හිඳින පිළිමයකි.
(3) භාවනානුයෝගී ඉරියව්වක් නිරූපිත පිළිමයකි.
(4) දහම් දෙසන අවස්ථාවක් නිරූපණය කරන්නකි.
(5) වජ්‍රාසනය මත වැඩහිඳින පිළිමයකි. (.........)

**24.** **N** අක්ෂරයෙන් දැක්වෙන සාරානාත් ස්ථම්භ ශීර්ෂය,
(1) ධර්මාශෝක රජු කළ ප්‍රථම ස්ථම්භ ශීර්ෂයයි.
(2) බුදුන්ගේ ප්‍රථම ධර්ම දේශනය සංකේතවත් කරන ස්ථම්භයයි.
(3) සිංහ රූ සතරක් මගින් සතර දිශාව දැක්වෙන ශීර්ෂයයි.
(4) බුදුන් වහන්සේගේ ධර්මය සිහිපත් කිරීම සඳහා නිර්මිතයි.
(5) මෞර්ය යුගයේ ඉදි වූ ස්ථම්භ ශීර්ෂයයි. (.........)

**25.** **O** අක්ෂරයෙන් දැක්වෙන නෙෆර්ටිටි නමින් හැඳින්වෙන මූර්තිය,
(1) පරමාදර්ශී කාන්තා රුවක් නිර්මාණය කිරීමකි.
(2) සම්ප්‍රදායික මිසර ලක්ෂණවලින් මිදුණ මූර්තියකි.
(3) නව රාජධානි සමයේ කළ ස්වාභාවික මූර්තියකි.
(4) මිසර සුරූපිනියකගේ උඩුකය මූර්තියකි.
(5) අමර්නාවලින් හමුවන කාන්තා උඩුකය මූර්තියකි. (.........)

- ප්‍රශ්න අංක **26** සිට **30** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන වරණය** තෝරන්න.

**26.** පුනර්ජීවන යුගයේ දක්නට ලැබෙන පොදු ලක්ෂණයක් වනුයේ,
(1) ග්‍රීක රෝම සම්භාව්‍ය කලාවේ රීතී භාවිතයට ගැනීමයි.
(2) 14-16 සියවස් තුළ යුරෝපයේ කලා අංශයන්හි පිබිදීමයි.
(3) ඉතාලියේ නව ශිල්පීන් අතුරෙන් බිහි වූ කලාවක් වීමයි.
(4) ස්වාභාවිකවාදය මුල්කොට ගත් සිතුවම් කලාවක් බිහිවීමයි.
(5) චිත්‍ර කලා මූලධර්ම ඒ අයුරින් ම භාවිතයට ගැනීමයි. (.........)

**27.** 43 කණ්ඩායමේ වැදගත් ම දායකත්වය වනුයේ,
(1) ආයතනගත සම්ප්‍රදාය වෙතට නූතනවාදී කලා භාවිතය හඳුන්වාදීම ය.
(2) ශාස්ත්‍රාලයීය කලා ශිල්ප ක්‍රම ඒ අයුරින් ම ප්‍රචලිත කිරීම ය.
(3) චිත්‍ර කලා මූලධර්ම ඒ ආකාරයෙන් ම ප්‍රචලිත කිරීම ය.
(4) යුරෝපීය නූතනවාදී කලා ලක්ෂණ එකතු කිරීම ය.
(5) බහු ශෛලීය කලා ලක්ෂණ ශ්‍රී ලාංකේය කලාව තුළ ස්ථාපනය කිරීම ය. (.........)

**28.** දෘශ්‍ය මාධ්‍ය භාවිතයේ දී පර්යාලෝකය යනුවෙන් හැඳින්වෙනුයේ,
(1) වර්ණ භාවිතයේ දී පැහැය අඩු වැඩි කිරීමෙන් දක්වන දෘශ්‍යමය ප්‍රයෝගයයි.
(2) මිනිස් ඇසේ ක්‍රියාකාරිත්වය අනුව වස්තුවක සැබෑ ස්වරූපය දැකීමයි.
(3) දුර හා ළඟ දැක්වීමට භාවිත කරනු ලබන දෘශ්‍යමය උපක්‍රමයයි.
(4) යමක් ඉදිරියෙන් දැකීමේ දී කෙටිවී පෙන්වීමේ උපක්‍රමයයි.
(5) වස්තුවක ස්වාභාවික පරිමාණ නිවැරදිව චිත්‍රණය කිරීමයි. (.........)

**29.** සන්නිදර්ශන චිත්‍ර කලාවේ ප්‍රධාන කාර්යභාරය විය යුත්තේ,
(1) වාණිජ අවශ්‍යතාවන්ට උචිත අයුරෙන් නිර්මාණය කිරීමයි.
(2) තේමාව උද්දීපනය වන සේ නිර්මාණය කිරීමයි.
(3) දෘශ්‍යමාන කළ අදහස් පැහැදිලිව සන්නිවේදනය කිරීමයි.
(4) අක්ෂරකරණය තුළින් අර්ථය පැහැදිලි කිරීමයි.
(5) මුද්‍රණයට සුදුසු පරිදි නිර්මාණය කිරීමයි. (.........)

**30.** පොළොන්නරු යුගයේ හමුවන චිත්‍ර කලාගාරය වන තිවංක පිළිමගෙය සම්බන්ධ වඩාත් සුදුසු ප්‍රකාශය දැක්වෙන වරණය මින් කුමක් ද?
(1) මෙහි සිතුවම් සඳහා දිව්‍යලෝක, බෝධිසත්ත්ව හා දේව සංකල්ප පාදක වී ඇත.
(2) බුද්ධත්වයෙන් පසු සිද්ධීන් නිරූපණයට ප්‍රමුඛතාව දී ඇත.
(3) ජාතක කතා රාශියක් ඇඳ ඇති ස්ථානයකි.
(4) නිසි පරිමාණයෙන් යුතු ක්‍රියාකාරී මානව රූ දක්නට ඇති ස්ථානයකි.
(5) සීගිරි චිත්‍ර හා සමාන සම්භාව්‍ය වර්ණමාලාවක් භාවිත කොට ඇත. (.........)

- ප්‍රශ්න අංක **31** සිට **35** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන වරණය** ඊට ඉදිරියෙන් දී ඇති වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරෙන් තෝරන්න.

**31.** මෙම රූපයේ දැක්වෙන්නේ,
(1) පොළොන්නරු දළදා මළුවේ පිහිටි පටිමාඝරයයි.
(2) ගඩොලින් ඉදි කළ වාස්තු විද්‍යා නිර්මාණයකි.
(3) හින්දු ආගමික වාස්තු විද්‍යා ලක්ෂණ අනුව ඉදි කරන ලද්දකි.
(4) පොළොන්නරුවේ හොඳින් ආරක්ෂා වී ඇති එකම බුදුගෙයයි.
(5) පරාක්‍රමබාහු රජ සමයේ ඉදි කළ බුදුගෙයකි.



(.........)

**32.** හඟුරන්කෙත පොත්ගුල් විහාරයේ පිහිටි මෙය,
(1) ලංකාවේ දක්නට ලැබෙන සිතුවමින් අලංකාර වූ චෛත්‍යයකි.
(2) නුවර යුගයට අයත්, විහාර මන්දිරයක් තුළ ඉදිකර ඇති චෛත්‍යයකි.
(3) දඹුලු විහාරයේ චෛත්‍යයට සමාන කුඩා චෛත්‍යයකි.
(4) ලෙන් විහාරයක් තුළ ස්ථාපිත වර්ණවත් චෛත්‍යයකි.
(5) සැරසිලි මෝස්තරවලින් අලංකෘත චෛත්‍යයකි.



(.........)

[හත්වැනි පිටුව බලන්න.

**33.** මෝගල් පාලන සමයේ කිරිගරුඬ මාධ්‍යයෙන් ඉදි වූ 'ටජ්මහල',



(1) රජ මාලිගාවක් ලෙස ඉදිකරන ලද්දකි.
(2) ස්මාරකයක් ලෙස ඉදිකරන ලද්දකි.
(3) පූජනීය ස්ථානයක් ලෙස ගොඩනගන ලද්දකි.
(4) කලාගාරයක් ලෙස ගොඩනගන ලද්දකි.
(5) මන්දිරයක් ලෙස ඉදිකරන ලද්දකි.

(.........)

**34.** ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ නටබුන් අතර දක්නට ඇති මෙම වාස්තු විද්‍යා නිර්මාණය



(1) නගරයේ අපවිත්‍ර ජලය රැස් කිරීම සඳහා ඉදිකළ ළිඳකි.
(2) ප්‍රභූ පන්තියේ පාලකයන් සඳහා ඉදිකළ ළිඳකි.
(3) නිවාස පේළියක් සඳහා ඉදිකළ පොදු ළිඳකි.
(4) කෘෂිකාර්මික කටයුතු සඳහා ඉදිකළ පොදු ළිඳකි.
(5) ජලය බෙදා හැරීම සඳහා එක්රැස් කිරීමට ඉදිකළ ළිඳකි.

(.........)

**35.** කොලෝසියම යනු,



(1) රෝම ගෘහ නිර්මාණ ලක්ෂණ ඇතුළත් ගොඩනැගිල්ලකි.
(2) රෝමවරුන්ගේ බලය පිළිබඳ ප්‍රකාශ කෙරෙන ලෞකික ගොඩනැගිල්ලකි.
(3) සටන් දර්ශන සඳහා පමණක් භාවිත කළ ස්ථානයකි.
(4) ඕවලාකාර බිම් සැලැස්මක් සහිත නටබුන් වූ ඉදිකිරීමකි.
(5) ප්‍රේක්ෂකාගාරයක් ලෙස පමණක් භාවිත වූ ස්ථානයකි.

(.........)

● ප්‍රශ්න අංක **36** සිට **40** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන වරණය** පහත සඳහන් චිත්‍රය ඇසුරෙන් තෝරන්න.



**36.** මෙම සිතුවමින් නිරූපණය කෙරෙනුයේ,
(1) තෝඩි රාගයයි.
(2) භෛරවී රාගයයි.
(3) ආසාවරී රාගයයි.
(4) මාලා ශ්‍රී රාගිනී රාගයයි.
(5) දීපක් රාගයයි.

(.........)

**37.** මෙහි සංරචන විධික්‍රමයක් වනුයේ,
(1) සමස්ත සංරචනයේ දී කාන්තාව කේන්ද්‍රීය චරිතය සේ යොදා ගැනීමයි.
(2) මධ්‍යයේ සිටින කාන්තාවගේ දෙපසින් මුවන් සමබරව දක්වා තිබීමයි.
(3) ඉහළින් සහ පහළින් දක්වා ඇති බෝඩරවල එකම මෝස්තර රටා පුන පුනා යොදා තිබීමයි.
(4) සිතුවමේ ඇති ශාබාද්වය දෙපසට සමබරව යොදා තිබීමයි.
(5) සමමිතිකබව පාදක කොටගෙන රේඛා හැඩතල ගලපා තිබීමයි. (………)

**38.** සිතුවමේ දක්නට ලැබෙන ශිල්පීය කුසලතාවයක් වන්නේ,
(1) ප්‍රධාන චරිතය තීව්‍ර කෙරෙන පරිදි සෙසු චරිත ඊට අනුරූප වන සේ යොදා ගැනීමයි.
(2) දෙපස මුවන් හා ගස් මධ්‍ය රුව දෙසට ආකර්ශනය වන අයුරෙන් යොදා තිබීමයි.
(3) කාන්තාවගේ වීණා වාදනයට සියලු බාහිර වස්තූන්ගේ අවධානය යොමු වී තිබීමයි.
(4) තේමාව උද්දීපනය වන සේ වර්ණ, රේඛා සහ හැඩතල රිද්මයානුකූලව යොදා තිබීමයි.
(5) පැතලි හැඩතල මෝස්තරයක අනුසාරයෙන් ප්‍රස්තුතයට ගැලපෙන පරිදි යොදා ගෙන තිබීමයි. (………)

**39.** සිතුවමේ චිත්‍රමය භාෂාවෙන් බලාපොරොත්තු වූයේ,
(1) ස්වාභාවිකත්වයෙන් තොරව ශෛලීගත හැඩතල තුළින් රාගයේ මතුවන හැඟීම් ප්‍රකාශ කිරීමයි.
(2) ඒක ලක්ෂ පර්යාලෝකය මෙන් ම බහු ලක්ෂ පර්යාලෝකය භාවිත කර තිබීමයි.
(3) චිත්‍රයේ වස්තූන් මතුකර දැක්වීම සඳහා පැතලි වර්ණ සංයමයෙන් යුතුව යොදාගෙන තිබීමයි.
(4) සත්ත්ව රූප හා ගස්, මධ්‍ය රුව දෙසට ආකර්ෂණය වන අයුරෙන් දැක්වීමෙන් රාගය තුළින් මතුවන ස්වභාවයක් පැහැදිලි කිරීමයි.
(5) මානව හා සත්ත්ව රූප ඉතා විස්තරාත්මක ලෙස ඔපෙක් පැහැයන්ගෙන් වර්ණ කිරීමයි. (………)

**40.** සිතුවමේ හැඟීම් නිරූපණයේ දී
(1) වාදනයේ අර්ථ රසය හා ශබ්ද රසය මතුවන ආකාරයට ස්වාභාවික ආශ්චර්යයන් දැක්වීමට ශිල්පියා ගත් උත්සාහය සාර්ථක ය.
(2) වාදනයේ භාවමය ස්වරූපය මතුකර දැක්වීමට බාහිර වස්තූන් සංරචනය කර ඇති අයුරෙන් ශිල්පීය කුසලතාව මැනවින් පිළිබිඹු වේ.
(3) ප්‍රස්තුතය මතුවන සේ ජීවී අජීවී වස්තූන් යොදාගෙන ඇති ආකාරය ප්‍රශස්ත ය.
(4) මධ්‍යයේ නිල් වර්ණය චිත්‍රයේ වස්තූන් මතුකර දැක්වීම සඳහා යොදා ගෙන ඇති ආකාරය විශිෂ්ට ය.
(5) මධ්‍ය කාන්තාවගේ වාදනය සොබාදහම සමග අනුගත කරමින් සිතුවම මගින් පෙන්වීම ශිල්පීය ප්‍රතිභාව පෙන්නුම් කරයි.
(………)

* *

සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

චිත්‍ර කලාව I
சித்திரக்கலை I
Art I

51 S I

## II කොටස

* මෙම කොටස අනුකොටස් **තුනකින්** සමන්විත ය.
* 'අ' කොටසින් ප්‍රශ්න **දෙකක්** හා 'ආ' සහ 'ඉ' යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.
(අවශ්‍ය තැන්හි පිළිතුරු සචිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ.)

## 'අ' කොටස

### (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

**1.** අනුරාධපුර යුගයෙන් ඇරඹි ස්තූපය හා ඒ ආශ්‍රිත වාස්තු විද්‍යාත්මක කලා අංග විවිධ අවධිවල වෙනස් වූ කලාත්මක ලක්ෂණ පිළිබිඹු කරයි.

(i) මුරගල හැඳින්වීම සඳහා භාවිත කරන නම් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) වාහල්කඩ පිළිබඳ කෙටි කලාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 05 යි)

(iii) අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා කොරවක්ගලෙහි සිදු වූ වෙනස්වීම් පිළිබඳ විශ්ලේෂණාත්මකව අගයන්න. (ලකුණු 08 යි)

**2.** යාපහුව වාස්තු විද්‍යා හා කැටයම් නිර්මාණයේ දී යොදාගත් ශෛලමය මාධ්‍යය, ගම්පොළ යුගයේ දී දැව මාධ්‍ය කැටයම් දක්වා වෙනස් විය.

(i) යාපහුව පර්වතය ආශ්‍රිතව ගොඩ නගා ඇති වාස්තු විද්‍යා ඉදිකිරීම් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) ගම්පොළ යුගයේ ලංකාතිලක විහාරයේ මූලික වාස්තු විද්‍යා අංග ලක්ෂණ පිළිබඳ කෙටි ඇගයීමක් කරන්න. (ලකුණු 05 යි)

(iii) යාපහුවේ ශෛලමය වාස්තු විද්‍යා අංග හා කැටයම්, ගම්පොළ දැවමය වාස්තු විද්‍යා අංග හා කැටයම් දක්වා වෙනස් වූ ආකාරය සංසන්දනාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි)

**3.** ශ්‍රී ලාංකේය නූතනවාදී කලා ප්‍රවේශයන් ගත් ශිල්පීන් අතුරෙන් චිත්‍ර හා මූර්ති විෂයයන් දෙක ම ප්‍රගුණ කළ අය සුවිශේෂී ය.

(i) ඒ. මාර්ක් ශිල්පියා විසින් නිර්මිත 'මිනිසා හා බල්ලෝ' මූර්තිය සඳහා ආභාස වී ඇති කලා ලක්ෂණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) තිස්ස රණසිංහ ශිල්පියා විසින් නිර්මිත 'මහීෂගේ මරණය' මූර්තිය පිළිබඳ කෙටි කලාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 05 යි)

(iii) "ශ්‍රී ලාංකේය නූතන චිත්‍ර ශිල්පීන් අතර මිශ්‍ර මාධ්‍ය භාවිතයෙන් කළ නිර්මාණ වඩාත් සුවිශේෂී වේ." ඒ. මාර්ක් ශිල්පියා විසින් නිර්මාණය කරන ලද 'නම් නොකළ (Untitled) සිතුවම' හා එච්.ඒ. කරුණාරත්න ශිල්පියා විසින් නිර්මිත 'ජීවිතයේ උණුසුම' කෘතිය ඇසුරෙන් ඉහත කියමන පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 08 යි)

## 'ආ' කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)

**4.** දකුණු ඉන්දීය කලා සම්ප්‍රදායයන් අතර පල්ලව හා චෝල කලා සම්ප්‍රදායයන් වඩාත් කැපී පෙනේ.

(i) චෝල කලා සම්ප්‍රදායයන් ඇසුරෙන් නිර්මිත ශිව දක්ෂිණ මූර්තියේ හා ශිව භික්ෂාටන මූර්තියේ මාධ්‍ය පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පල්ලව කලා සම්ප්‍රදායට අයත් 'ආකාශ ගංගාවරෝහණය' කැටයම පිළිබඳ කෙටි කලාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 05 යි)

(iii) පල්ලව කලා නිර්මාණයක් වූ පංච පාණ්ඩව රථ දෙවොල අතර ඇති 'භීම රථ දෙවොල' හා චෝල කලා සම්ප්‍රදායේ 'රාජ රාජේශ්වර දෙවොල' පිළිබඳ ආකෘතිය හා වාස්තු විද්‍යා ලක්ෂණ ඇතුළත් සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 08 යි)

**5.** නූතන ඉන්දියානු කලා ශිල්පීහු, යුරෝපීය ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී කලා ලක්ෂණ බහුලව භාවිත කළ ද, ඉන්දීය නවජීවන ව්‍යාපාරයේ ශිල්පීහු ඉන්දීය හා පෙරදිග රීතීන් හා ශිල්ප ක්‍රම අනුගමනය කළහ.

(i) ඉන්දීය නවජීවන ව්‍යාපාරයට අයත් පුරෝගාමී සිත්තරෙකු වන අබනින්ද්‍රනාත් තාගෝර්ගේ සිතුවම් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) අම්රිතා ෂර්ගිල්ගේ සිතුවම් සඳහා බලපෑම් කළ චිත්‍ර කලා ශෛලීන් හා ක්‍රමවේද පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05 යි)

(iii) ජෙමිනි රෝයිගේ 'බළලා සහ පොකිරිස්සා' සිතුවම සහ නන්දලාල් බෝස්ගේ 'විරහව' සිතුවම් සඳහා ලැබූ ආභාසය, ශෛලීය ලක්ෂණ හා සිතුවම් අතර සමාන අසමානතා පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 08 යි)

## 'ඉ' කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය)

**6.** මිසර හා රෝම ශිෂ්ටාචාර තුළින් විශිෂ්ට කලා නිර්මාණ රැසක් ලොවට දායාද විය.

(i) මිසර ශිෂ්ටාචාරයේ නව රාජධානි සමයට අයත් වාස්තු විද්‍යාත්මක ලක්ෂණ හොඳින් පිළිබිඹු වන දේවස්ථාන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) රෝම සිතුවමක් වූ 'ඩයෝනීසියස්ගේ දේව වන්දනාව' හි, ගැහැනියකට දඬුවම් කරන අවස්ථාව නම් සිතුවමේ මානව රූ සම්පිණ්ඩනය හා සංරචනාත්මක ලක්ෂණ කෙටියෙන් අගයන්න. (ලකුණු 05 යි)

(iii) මිසර කලාවට අයත් 'මෙන්කුරේ රජ සහ බිසව' මූර්තියේ ගතික ශෛලීගත ලක්ෂණ හා රෝම කලාවට අයත් 'ඔගස්ටස් සීසර්' මූර්තියේ රිද්මික ස්වාභාවික ලක්ෂණ පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 08 යි)

**7.** ඝනිකවාදය, අධිතාත්ත්විකවාදී කලාව හා ව්‍යුක්තවාදී කලාව විසි වන සියවසේ බිහි වූ පුරෝගාමී කලා ව්‍යාපාරයන් ය.

(i) ඝනිකවාදී කලා ප්‍රවාහයේ පුරෝගාමී චිත්‍ර ශිල්පීන් **දෙදෙනෙකු** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ව්‍යුක්ත ශෛලියක් අනුගමනය කරමින් නිර්මාණකරණයට පිවිසි වසිලි කැන්දිනෙස්කිගේ 'සංරචනය VII (Composition VII)' නම් වූ සිතුවම පිළිබඳ කෙටි ඇගයීමක් කරන්න. (ලකුණු 05 යි)

(iii) ෆ්‍රීඩා කාලෝගේ 'ෆ්‍රීඩා දෙදෙනා (Two Fridas)' නම් වූ සිතුවම හා සැල්වදෝර් ඩාලිගේ 'නොමියෙන මතකය (The Persistence of Memory)' සිතුවම සඳහා පාදක වූ සිද්ධාන්ත හා භාවිත උපක්‍රම පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 08 යි)

* * *

AL/2026/51/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

| | |
|---|---|
| චිත්‍ර කලාව | II |
| சித்திரக்கலை | II |
| Art | II |

**51 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

| | |
|---|---|
| අමතර කියවීම් කාලය | - මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - 10 நிமிடங்கள் |
| Additional Reading Time | - 10 minutes |

**අමතර කියවීම් කාලය ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් අධ්‍යයනය කිරීම සඳහා යොදාගන්න.**

**උපදෙස්:**

- ඔබේ **විභාග අංකය**, ඔබ චිත්‍රය අඳින කඩදාසියේ **පසුපිටෙහි** පැහැදිලිව ලියන්න.
- ඔබ වෙත සපයා ඇති විශේෂ **ඇඳීමේ කඩදාසිය** (Drawing paper) වර්ණ චිත්‍රය ඇඳීම සඳහා භාවිත කරන්න. වෙනත් කිසිම චිත්‍රයක් හෝ අධ්‍යයන සටහනක් ඇඳීම අවශ්‍ය නොවේ.
- ඔබගේ චිත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට එය සම්පූර්ණයෙන් ම වියළී තිබීම වැදගත් ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින්, එය ඔබට අවාසිදායක විය හැකි ය.

## ස්වභාවිකත්ව අධ්‍යයනය හා නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය

පහත සඳහන් උපදෙස් සැලකිල්ලට ගෙන ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය ඇඳ, වර්ණ කරන්න.

* කඩදාසියේ තලය, අර්ථවත්ව භාවිත කරමින් චිත්‍රය සම්පිණ්ඩනය කරන්න.

* ද්‍රව්‍යයන්ගේ ගතිලක්ෂණ, මතුපිට ස්වභාවය, පරිමාණය, ඇස් මට්ටම, ත්‍රිමාණ ලක්ෂණ හා පර්යාලෝක රීති පිළිබඳ සැලකිලිමත් වන්න.

* ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන ආකාරයට ඇඳ, ඒ මත ආලෝකය හා අඳුර පතිත වී ඇති අයුරු සැලකිල්ලට ගෙන වර්ණ කරන්න.

* වර්ණ මාධ්‍යය හැසිරවීමේ ශිල්ප ක්‍රම අර්ථවත්ව භාවිත කරන්න.

* ද්‍රව්‍ය සමූහයට ගැළපෙන පරිදි වර්ණවත් පසුබිමක් යොදන්න.

* ද්‍රව්‍ය සමූහය තබා ඇති ධාරකයේ (ලෑල්ලේ) පරිමාණය ද්‍රව්‍ය සම්පිණ්ඩනයට ගැළපෙන පරිදි වෙනස් කරගැනීමට හැකි ය.

* දිය සායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල්, ඇක්‍රලික්, පාට පැන්සල් යනා දී ඕනෑම මාධ්‍යයක් හෝ මාධ්‍ය කිහිපයක් මිශ්‍රිතව හෝ භාවිත කළ හැකි ය.

* * *

PAST PAPERS WIKI
Past Papers Wiki
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

චිත්‍ර කලාව III
சித்திரம் III
Art III

51 S III

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

- ඔබේ **විභාග අංකය** හා තෝරාගත් **ප්‍රශ්න අංකය** ඔබ චිත්‍රය අඳින කඩදාසියේ **පසුපිටෙහි** පැහැදිලි ව ලියන්න.
- දිය සායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල්, ඇක්‍රිලික්, පාට පැන්සල් යන එක් මාධ්‍යයක් හෝ මෙම මාධ්‍යයන් කිහිපයක් මිශ්‍රිත ව හෝ භාවිත කළ හැකි ය.
- අවශ්‍ය අයට විෂු කඩදාසි සපයනු ලැබේ.
- චිත්‍රය භාර දෙන විට, එය සම්පූර්ණයෙන් ම වියළී තිබීම වැදගත් ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින් එය ඔබට අවාසිදායක විය හැකි ය.

- පහත සඳහන් **අ, ආ** සහ **ඉ** යන කොටස් තුන අතුරෙන් **එක්** මාතෘකාවක් **පමණක්** තෝරාගෙන, වර්ණ චිත්‍රයක් නිර්මාණය කරන්න.

## 'අ' කොටස - චිත්‍ර සංරචනය

1. වාහනයක දුර ගමනක් යන පිරිසක් අතරමග තැඹිලි බී පිපාසය සංසිඳුවා ගන්නා අවස්ථාවක්
2. මැතිවරණ සමයේ ගෙයින් ගෙට ගොස් මිනිසුන් හමුවී ප්‍රචාරණ කටයුතුවල නිරතවන පක්ෂ ආධාරකරුවෝ
3. මහමගට පිවිසි ගව රංචුවක් නිසා ඇති වූ වාහන තදබදයක්
4. සිනමා දර්ශනයක්/සංගීත ප්‍රසංගයක්/වේදිකා නාට්‍යයක් නිමවී පිටතට පැමිණෙන ප්‍රේක්ෂකයන්

## 'ආ' කොටස - මෝස්තර නිර්මාණය

5. සම්ප්‍රදායික සැරසිලි මෝස්තර ඇසුරෙන් සකසාගත් නව නිර්මාණාත්මක හැඩතල යොදා විද්‍යාලයීය පෙරදිග තූර්ය වාදන කණ්ඩායමකට සුදුසු ඇඳුම් විලාසිතාවක් (ආදර්ශ රූපයකට ඇඳුම් අන්දවා ඇති පරිදි) සැලසුම් කර වර්ණ කරන්න.
6. එක් ටයිල් කැටයකට අවම වශයෙන් විසිතුරු මත්ස්‍ය හැඩ දෙකක් සහ ජලජ ශාක හැඩ භාවිත කරමින්, ටයිල් කැට හතරක් එකතු වූ විට ව්‍යාප්ත මෝස්තරයක් සැදෙන ආකාරයට සැලසුම් කර වර්ණ කරන්න.
7. ප්‍රදර්ශනයකට තැබීමට උචිත ආකාරයේ කෘෂිකර්මාන්තයට අදාල ක්‍රියාකාරකම් නිරූපිත බිතු කැටයමක් 5' × 10' අඩි ප්‍රමාණයෙන් සැලසුම් කර වර්ණ ගන්වන්න. (ප්‍රමාණය පරිමාණානුකූලව සකසා ගන්න.)

## 'ඉ' කොටස - ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය

8. ළමා හිංසනය වැළැක්වීම අවධාරණය කිරීමේ අරමුණින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සංවිධානය කරන පෝස්ටර් චිත්‍ර තරගය සඳහා ඉදිරිපත් කිරීමට සුදුසු පෝස්ටරයක් සැලසුම් කර වර්ණ කරන්න.
9. නව චොකලට් සන්නාමයක් පිළිබඳ පාරිභෝගිකයන් දැනුවත් කිරීම සඳහා වෙළඳසැලක එල්ලා තැබීමට සුදුසු චලන ප්‍රදර්ශන දැන්වීමක් (Dangler) සැලසුම් කර වර්ණ ගන්වන්න.
10. කැස්බෑවන් සුරැකීමේ සංවිධානයකට උචිත ලාංඡනයක් සැලසුම් කර වර්ණ ගන්වන්න. (ලාංඡනයේ අවසන් කෘතිය දක්වා පැමිණි ක්‍රියාවලිය ඉදිරිපත් කරන්න.)

PAST PAPERS WIKI
www.PastPapers.WiKi

* * *

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library